# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1640/23 - 2010 පෙබරවාරි 10 වැනි බදාදා - 2010.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන ) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 (1අ) වගන්තිය සහ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය 2(3) (අ) (i) වගන්තිය යටතේ කරනු ලබන නියමය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන ) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 (1අ) වගන්තිය සහ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය 2 (3) (අ) (i) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මම මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර මහා නගර සභාවේ නගරාධිපති එල්. බී. අළුවිහාරේ මහතාගේ නගරාධිපති ධුරය දැරීම වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවමි.

තවද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන ) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥාපනතේ 277 (1ආ) (අ) (i) වගන්තිය සහ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය 2 (3) (අ) (i) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වහාම ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර මහා නගර සභාවේ නගරාධිපතිවරයාගේ කාර්යයන් ඉටු කිරීමටත් නගරාධිපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත් නියෝජ්‍ය නගරාධිපති කේ. එල්. සුමින්ද වික්‍රමසිංහ මහතාට විධානය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2010 පෙබරවාරි මස 08 වැනි දින.
මහනුවර,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02-601/1

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන ) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 (1අ) වගන්තිය යටතේ සහ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 07 දරන පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරිමේ ප්‍රඥප්තිය 2 (2) වගන්තියෙන් ද මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන මම මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර මහා නගර සභාවේ නගරාධිපති එල්. බී. අළුවිහාරේ මහතා විසින් මහා නගර සභා ආඥාපනතේ 277 (1) වගන්තියේ හා මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2 (1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්ද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස 03ක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරී එන්. මහේන්ද්‍රරාජා මහතා මෙයින් පත් කරමි.

මෙම නිලධාරියාට මෙම පරීක්ෂණයට අදාලව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂමක බලතල තිබිය යුතු ය.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා
පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2010 පෙබරවාරි 08 වැනි දින,
මහනුවර,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

02 - 601/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.